# පුනරුත්ථාපන කාර්යාංශය
## புனர்வாழ்வுப் பணியகம்
## BUREAU OF REHABILITATION
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
நீதி மற்றும் தேசிய ஒருமைப்பாடு அமைச்சு
MINISTRY OF JUSTICE AND NATIONAL INTEGRATION

RvA C 155 | SLAB ISO/IEC: 17021 EMS-001-01

අංක: 462/2, කඩුවෙල පාර,
ගනහේන, බත්තරමුල්ල.

இல: 462/2, கடுவெல வீதி,
கனஹேன, பத்தரமுல்லை.

No: 462/2 , Kaduwela Road,
Ganahena , Battaramulla.


මගේ අංකය / எனது இல / My No: පුනකා/ප්‍ර/01/01/2025(152)

ඔබේ අංකය / உமது இல / Your No:

15 MAY 2025

දිනය / திகதி / Date: 2025.04.29

ලේකම්,
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය.

ගරු ලේකම් තුමියණි,

**<u>විෂ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කළ හැකි සංඛ්‍යාව දැනුම් දීම.</u>**

යොමුව:

අ. අංක JSC/SEC/CIR- L/2022 හා 12/2012 දරණ 2022.09.20 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපිය.

1. මෙම කාර්යාංශය යටතේ පාලනය වන පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුනෙහි දළ වශයෙන් පුනරුත්ථාපනලාභීන් 1120 ක පමණ ප්‍රමාණයක් එකවර පුනරුත්ථාපනය සඳහා යොමු කළ හැකි අතර, දැනට පුනරුත්ථාපනය වනු ලබන පුනරුත්ථාපනලාභීන් සංඛ්‍යාව සහ තවදුරටත් එම මධ්‍යස්ථානයන් වෙත ඇතුළත් කර ගත හැකි පුනරුත්ථාපනලාභීන් සංඛ්‍යාව පහත සඳහන් පරිදි බැව් දන්වා සිටිමි.

| මධ්‍යස්ථානය | පුනරුත්ථාපනය කළ හැකි පුනරුත්ථාපනලාභීන් ප්‍රමාණය | දැනට සිටින පුනරුත්ථාපනලාභීන් ප්‍රමාණය | තවදුරටත් ඇතුළත් කර ගත හැකි පුනරුත්ථාපනලාභීන් ප්‍රමාණය |
|---|---|---|---|
| නවෝදාව ප්‍රතිකාරක මධ්‍යස්ථානය - කන්දකාඩු | 500 | 217 | 283 |
| නවෝදාව තෘතියික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර | 500 | 124 | 376 |
| සාරංගා මධ්‍යස්ථානය - වව්නියාව | 120 | 113 | 7 |
| **එකතුව** | **1120** | **454** | **666** |

2. තවද පුනරුත්ථාපන ක්‍රියාවලිය මාස 06 ක කාල සීමාවක් තුළ සිදු කරනු ලබන බැවින් සහ පුනරුත්ථාපනලාභීන් වරින්වර පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත ඇතුළත් වන ආකාරය අනුව අදාළ කාල සීමාව අවසානයේ සමාජගත කරනු ලබන පුනරුත්ථාපනලාභීන් ප්‍රමාණයන් අනුව අඛණ්ඩව පුනරුත්ථාපන සඳහා යොමු කිරීමේ හැකියාවක් පවතී.

3. ඒ අනුව යොමුගත චක්‍රලේඛයෙහි දක්වා ඇති නිර්ණායකයන්ට අනුකූලව පුනරුත්ථාපනලාභීන් පුනරුත්ථාපනය කිරීමේ හැකියාවක් පවතින අතර ඔබ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක අදාළ ආයතන දැනුවත් කර විෂ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අවැසි ඉදිරි කටයුතු සිදු කරන මෙන් ඉල්ලා සිටිමි.

එම් සී වී ගෝමස්
කර්නල්
සහකාර කොමසාරිස් (පුනරුත්ථාපන/පපුප්‍රශා)
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් වෙනුවට

පිටපත් :
1. ලේකම් - මහජන ආරක්ෂක අමාත්‍යාංශය
2. අධිකරණ සේවා කොමිෂන් සභාව - සියලුම මහේස්ත්‍රාත්වරුන් දැනුවත් කිරීම සඳහා
3. සභාපති - විෂ මත්ද්‍රව්‍ය හා අන්තරායකර ඖෂධ භාවිතය වළක්වාලීම සඳහා කාර්ය සාධක බලකාය.
4. පොලිස්පති - පොලිස් මූලස්ථානය
5. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් - බන්ධනාගාර මූලස්ථානය
6. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය - බස්නාහිර පළාත


පොදු / பொது / General: +9411 2577457, +9411 2883891
ෆැක්ස් / தொலைநகல் / Fax: +9411 2883737, +9411 2883899
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail: bcg.rehabilitation@gmail.com
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.bor.gov.lk